**කෝරලේපත්තු ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද පසුගිය වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 19 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 12 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කෝරලේපත්තු ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු බදු සහ බලපත්‍ර ගාස්තු ආදායම් රු.545,500 ක් ආදායම් ගිණුමට බැර කිරීම වෙනුවට පොදු තැන්පත් ගිණුමට බැර කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වන ආදායම් මෙම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**
**-----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**
**----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.27,630,462 කි. ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.12,468,433 ක් විය.

**2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**
**----------------------------------------**

සභාව විසින් පවත්වාගෙන යනු ලබන මුදල් පොත අනුව සමාලෝචිත වර්ෂයේ එක් එක් මාසය අවසානයේ රු.මිලියන 25.65 සිට රු.මිලියන 29.66 ක් දක්වා වන පරාසයක අතැති මුදල් දක්නට ලැබුණි. මෙය පොළී උපයාගත හැකි ස්ථාවර තැන්පතු හෝ ඒක්ෂණ තැන්පතුවල ආයෝජනය කර ආදායම් උපයා ගැනීමට කටයුතු නොකිරීම නිසා සභාව විසින් වර්ෂයකට ආසන්න වශයෙන් රු.මිලියන 2.75 ක පොළී ආදායමක් අහිමි කරමින් පැවතුණි.

**2.3 ආදායම් කළමනාකරණය**

**2.3.1 මුද්දර ගාස්තු**

පළාත් භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු හිඟ මුදල් රු.12,548,980 ක් අයකර ගැනීමට 2017 මැයි 31 දින දක්වා කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා අධිකාරී පනතේ 149 පරිච්ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කළ සංචාරක හෝටල්වලින් එහි මුළු ආදායමින් සියයට 01 ක් බදු වශයෙන් අයකළ යුතු වුවත් ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කළ පාසිකුඩා ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන සංචාරක හෝටල් 15 කින් බදු මුදල් 2017 මැයි 31 දින දක්වා අයකර ගෙන නොතිබුණි.

(ආ) සභාවට පරිත්‍යාගශීලියකු විසින් 1980 ජූලි 06 දිනැති අංක 4772 දරන හිමිකම් ඔප්පුව යටතේ පරිත්‍යාග කරනු ලැබූ පර්චස් 14 ක ඉඩම පවරාගෙන නඩත්තු කිරීම පැහැර හැරීම හේතුවෙන් පෞද්ගලික පාර්ශව විසින් එම ඉඩම ආක්‍රමණය කර භාවිතා කරමින් පැවතුණි. එසේ වුවත්, සභාව විසින් මේ දක්වා මේ සම්බන්ධයෙන් කිසිඳු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

සමාලෝචිත වර්ෂයේදී රු.1,998,000 ක වියදමින් ජල නල සවි කර නාසිවන් (Nasivan Island) දූපතේ පවුල් 36 කට බෙදා හරිමින් තිබූ ජලය බීමට නුසුදුසු බවට 2016 මැයි 27 දිනැති ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් ලබාගෙන තිබූ පරීක්ෂණ සහතිකය මඟින් අනාවරණය කර තිබුණි. එසේ වුවත්, ජලය පිරිපහදු කර සැපයීමට හෝ සුදුසු වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ කටයුතු නොකර අඛණ්ඩව එම ජලය බෙදා හරිමින් පැවතුණි.

**3.3 මතභේදාත්මක ස්වරූපයේ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජනතාවගෙන් රැස්කර ගනු ලැබූ වරිපනම්වලින් අනෙකුත් ආයතනවලට ණය ලබාදීම සභාවේ අරමුණුවලට පටහැනි එක් විෂයයක් වී තිබුණි. එසේ වුවත්, ඒරාවූර් නගර සභාව විසින් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ ඉදිකරමින් පවතින කාර්යාල ගොඩනැගිලි කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා කොමසාරිස් හෝ පළාත් භාණ්ඩාගාර අවසරයකින් තොරව ප්‍රාදේශීය සභාව විසින් ඒරාවූර් නගර සභාවට 2016 සහ 2017 වර්ෂවලදී රු.මිලියන 10 ක මුදලක් ණය වශයෙන් ලබා දී තිබුණි.

(ආ) 2002 වර්ෂය දක්වා සභාවට අයත් ඉඩමේ ක්‍රියාත්මකව පැවැති කාර්යාලය එම වර්ෂයේ පැවැති යුධ වාතාවරණය හේතුවෙන් ගිනි තැබීමෙන් පසු අතහැර දමා තිබූ එම ඉඩමේ නව වෙළඳ පොල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු. 6,290,000 ක පිරිවැයකින් ඉදිකිරීමට වර්ෂයේදී කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් එම ඉඩමේ රු.1,062,663 ක් පිරිවැය වූ ඉදිකිරීම් කටයුතු නිම කළ පසු අදාළ ඉඩම, ප්‍රදේශයේ පල්ලියට අයිති බව සඳහන් කිරීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබුණි. එසේ වුවත්, එම ඉඩමේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ලිපි ලේඛන කිසිවක් සභාව සතුව නොමැති වීම හේතුවෙන් වෙළඳපොල ඉදිකිරීම සඳහා වැයකළ මුදල නිෂ්ඵල වියදමක් බවට පත් වී තිබුණි.

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

**මාර්ගවලට බොරළු දැමීම**

------------------------------

පොදු අරමුදල් ඵලදායීව භාවිතා කිරීමේ අරමුණෙන් පළාත් සභා සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වෙන්කරනු ලබන අරමුදල් යටතේ ක්‍රියාත්මක කරනු ලබන කර්මාන්ත සඳහා දිගු කාලයක් ගතවන කාපට් කිරීම, කොන්ක්‍රීට් දැමීම හා තාර දැමීම් හැර බොරළු දැමීම් ආදි තාවකාලික මාර්ග ඉදිකිරීමේ කටයුතු සිදු නොකළ යුතු බවට 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛයේ සඳහන් කර තිබුණත්, ඒ පිළිබඳව සැලකිල්ල යොමු නොකොට සමාලෝචිත වර්ෂයේ සභාව විසින් මාර්ග දෙකකට රු.798,150 ක වියදමින් බොරළු දමා තිබුණි.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව අනියම් සහ කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවා ගැනීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගෙන නියමිත මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම් සඳහා වන අවසරය ලබාගැනීමෙන් අනතුරුව පමණක් සේවකයින් බඳවාගත යුතුවුවත්, එලෙස පූර්ව අනුමැතිය සහ අවසරය ලබා ගැනීමකින් තොරව 2015 සහ 2017 වර්ෂවලදී සේවකයින් 63 දෙනෙකු අනියම් සහ කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබුණි.

(ආ) 2011 පෙබරවාරි 24 දිනැති අංක 02/2011 දරන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව, අනියම් සහ තාවකාලික පදනමින් බඳවා ගනු ලබන සේවකයින් සඳහා සේවකයින්ගෙන් සියයට 8 ක දායක මුදලක් සහ සේවායාගෙන් සියයට 12 ක දායක මුදලක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට යැවිය යුතුය. එසේ වුවත්, 2015 සහ 2017 වර්ෂවලදී අනුයුක්ත කරනු ලැබූ සේවකයින් 63 දෙනෙකු සඳහා එලෙස දායක මුදල් යවා නොතිබුණි.

# 4. යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

------------------------------------

## 4.1 නිරවුල් නොකළ විගණන ඡේද

-----------------------------------

සභාව සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරනු ලැබූ විගණන ඡේදවලින් අනාවරණය කරනු ලැබූ ඌනතාවයන් සහ අඩුපාඩු සම්බන්ධයෙන් සභාව මේ දක්වා නිවැරදි කර නොතිබූ විගණන ඡේදවලට යොමුව පහත දැක්වේ.

| වාර්තාවට යොමුව | | අන්තර්ගත විෂයය |
| --- | --- | --- |
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2015 | 2.2.3 | සේවකයින්ගෙන් අයවිය යුතු හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| 2015 | 2.2.4(අ) | ඇප මුදල් ලබාගත යුතු නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |

## 5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන් |
| --- | --- |
| (අ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමට පියවර ගැනීම. |